# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2418/26 - 2025 ජනවාරි මස 08 වැනි බදාදා - 2025.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XV)(සී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තිය සමග කියවිය යුතු 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය, හරිනි අමරසූරිය වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලය පිහිටුවමින් එකී පනතේ 21 වන වගන්තිය යටතේ සාදන ලද (කලින් කලට සංශෝධිත පරිදි වූ) 1999 අගෝස්තු මස 17 වැනි දින අංක 1093/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය, ඒ උපලේඛනයේ 1 වන තීරයේ දැක්වෙන "පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය" යන අයිතමයට අනුරූපව උපලේඛනයේ 2 වන තීරයේ දැක්වෙන "ව්‍යවහාරික පෝෂණ අධ්‍යයන අංශය" යන සටහන වෙනුවට පහත දැක්වෙන සටහන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"පෝෂණය හා ආහාරවේදය අධ්‍යයන අංශය".

**හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0085


1A - PG 6985 — 455 (2025/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*